# අල්ලස් හෝ දූෂණ චෝදනා විමර්ශන කොමිෂන් සභාව

இலஞ்சம் அல்லது ஊழல் பற்றிய சார்த்துதல்களை புலனாய்வு செய்வதற்கான ஆணைக்குழு

COMMISSION TO INVESTIGATE ALLEGATIONS OF BRIBERY OR CORRUPTION

තැ.පෙ. 1431, 36, මලලසේකර මාවත, කොළඹ 07. த.பெ. 1431, 36, மலலசேகர மாவத்தை, கொழும்பு 07. P.O. Box 1431, 36, Malalasekara Mawatha, Colombo 07.

දුරකථන අංක/தொலைபேசி/Telephone: +94 112596365, +94 112596360 ක්ෂණික ඇමතුම් අංකය/Hotline: 1954 ෆැක්ස්/மின்னஞ்சல்/Fax: +94 112595045

වෙබ් අඩවිය/இணையத்தளம்/website: www.ciaboc.gov.lk විද්‍යුත් තැපෑල/மின்னஞ்சல்/E-mail : ciaboc_gen@ciaboc.gov.lk


2026.01.29 මාධ්‍ය නිවේදන අංක 2026/008

ප්‍රධාන කර්තෘ/ ප්‍රවෘත්ති අධ්‍යක්ෂ
සියලු මාධ්‍ය ආයතන

**<u>මුදල් විශුද්ධිකරණ වරදට ආධාර හා අනුබල දීමේ වරදට ව්‍යාපාරිකයෙකු අත්අඩංගුවට</u>**

හිටපු අමාත්‍ය කෙහෙළිය රඹුක්වැල්ලට රු.748,000,000/- ක මුදල් ඍජුව හෝ වක්‍රව නීති විරෝධී ක්‍රියාකාරකමකින් උපලද්ද වූ මුදල් විශුද්ධිකරණය කිරීමේ දී තමාට හිමි නොවන මුදලක් බව දැන දැනම රු.30,000,000/- ක මුදලක් තම සන්තකයේ තබා ගැනීමෙන් 2006 අංක 05 දරණ මුදල් විශුද්ධිකරණය වැළැක්වීමේ පනතින් සංශෝධිත 2011 අංක 40 දරණ මුදල් විශුද්ධිකරණය වැළැක්වීමේ පනතේ මුදල් 3 (1) (b) සහ මුදල් විශුද්ධිකරණ වරද සඳහා ආධාර අනුබල ලබාදීමටත් මුදල් විශුද්ධිකරණ පනතේ 3 (2) වරද සිදු කිරීම යන චෝදනා යටතේ ව්‍යාපාරිකයෙකු වූ ගබ්බෙල මොහොට්ටාලගේ නිහාල් සිසිර කුමාර යන අය 2026.01.28 වන දින පෙ.ව.3.35ට පමණ අල්ලස් හෝ දූෂණ චෝදනා විමර්ශන කොමිෂන් සභාවේ විමර්ශන නිලධාරීන් විසින් මෙම අත්අඩංගුවට ගැනීම සිදු කරන ලදි.

අත්අඩංගුවට ගන්නා ලද සැකකරු කොළඹ ප්‍රධාන මහේස්ත්‍රාත් අධිකරණය වෙත ඉදිරිපත් කිරීමෙන් අනතුරුව 2026 පෙබරවාරි මස 10 වන දින දක්වා රක්ෂිත බන්ධනාගාරගත කරන ලදි.

අල්ලස් හෝ දූෂණ චෝදනා විමර්ශන කොමිෂන් සභාවේ මාධ්‍ය ඒකකය
0112502672